සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 12 | විෂයය / பாடம் / Subject: යුරෝපා ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours |

**උපදෙස් :**

* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
* මෙම ප්‍රශ්න පත්‍රය A, B, C ලෙස කොටස් **තුනකින්** සමන්විත ය.
* A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
* B හා C **කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක්වත් තෝරාගෙන ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.
  (**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා යුරෝපයේ දළ සිතියමක් සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති යුරෝපයේ දළ සිතියමේ පහත ස්ථාන ලකුණු කර නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| 1. | රෝමය | 7. | කොන්ස්තන්තිනෝපලය |
| 2. | පෘතුගාලය | 8. | මධ්‍යධරණී මුහුද |
| 3. | ග්‍රීසිය | 9. | උතුරු මුහුද |
| 4. | කෝසිකා | 10. | පෝ ගඟ |
| 5. | ඉංග්‍රිසි ඕඩය | 11. | කළු මුහුද |
| 6. | පැරීසිය | 12. | ලන්ඩන් |

(ලකුණු1x12=12)

## B කොටස

2. පුරාණ ග්‍රීකයන්ගේ සංස්කෘතියේ පහත දැක්වෙන අංශවලින් ඕනෑම දෙකක ඔවුන්ගේ කාර්ය සංසිද්ධිය සැකෙවින් විස්තර කරන්න.

   1. ආගම
   2. දර්ශනය
   3. සාහිත්‍යය
   4. කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය

(ලකුණු 08 x 2 = 16)

3. “ජාතික රාජ්‍යය යනු නූතන යුගයේ ආරම්භයේ යුරෝපයේ පහළ වූ සුවිශේෂී දේශපාලන සංවිධානයකි”

   (i) ජාතික රාජ්‍යයන් ආරම්භ වූ යුරෝපා රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

   (ii) ඉහත ඔබ නම් කරන ලද එක් රටක ජාතික රාජ්‍ය ගොඩනැගීමෙහිලා වැදගත් මෙහෙයක් ඉටුකල පාලකයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

   (iii) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ සැකෙවින් දක්වන්න. (ලකුණු 05)

   (iv) ප්‍රථමයෙන් ජාතික රාජ්‍යයන් බිහිවූ රටවල ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 07)

4. "පුනරුදය යනු මධ්‍යතන යුරෝපය නූතන යුරෝපය බවට පරිවර්තනය කළ ප්‍රධාන සාධකයයි."

(i) පුනරුදය ආරම්භ වූ රට හා නගරය නම් කරන්න. (ලකුණු 02)

(ii) පුනරුදය යන්නෙන් අර්ථ දැක්වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) පුනරුදය ඇතිවීමට බලපෑ ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ලකුණු 04)

(iv) පුනරුදයේ ප්‍රතිඵල ඇසුරින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 07)

5. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක් පිළිබඳ ඓතිහාසික වැදගත්කම පරීක්ෂා කරන්න.

(i) ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භය හා ඉන් ලොවට ලද දායද.

(ii) රෝම ශිෂ්ඨාචාරයේ ආගම හා අධ්‍යාපනය.

(iii) බ්‍රිතාන්‍යය පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීම.

(iv) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට බලපෑ ආගමික හේතු (ලකුණු 08 x 2 = 16)

## C කොටස

6. (i) කාර්මික විප්ලවය එංගලන්තයෙන් ආරම්භ වීමට බලපෑ හේතු හතරක් නම් කරන්න. (ලකුණු 02)

(ii) කාර්මික විප්ලවය ආරම්භ වූ ප්‍රධාන ක්ෂේත්‍ර තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) කාර්මික විප්ලවය වෙනත් ක්ෂේත්‍රවල ව්‍යාප්ත වූ ආකාරය සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 06)

7. ප්‍රංශ විප්ලවය ආරම්භ වීමට බලපාන දේශපාලන, ආර්ථික, සමාජ සංස්කෘතික හේතුන් පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 16)

8. (i) ඇමෙරිකානු නිදහස් සටන ඇති වීමට බලපෑ ප්‍රධාන හේතු විග්‍රහ කරන්න. (ලකුණු 10)

(ii) ඇමෙරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 06)

9. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳ පරීක්ෂා කරන්න.

(i) තිස් අවුරුදු යුද්ධයේ ප්‍රධාන අවස්ථා

(ii) පෘතුගාලයේ දේශගවේෂණ ව්‍යාපාරය

(iii) දේශගවේෂණ ව්‍යාපාරය ආරම්භ වීමට බලපෑ හේතු

(iv) ඉස්ලාම් ශිෂ්ඨාචාරයෙන් යුරෝපය ලද දායාද

(ලකුණු 8 x 2 = 16)